www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ලංකාව තුල ළමා දුප්පත්කම ඉහල මට්ටමක

සකුන්ත ජයවර්ධන විසිනි
2017 පෙබරවාරි 27

ප්‍රමුඛ බුද්ධි පර්ෂදයක් වන ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය (Institute of policy studies) විසින් ශ්‍රී ලංකාවේ ආර්ථික තත්වය-2017 (Sri Lanka State of the Economy) නමින් මෑතකදී නිකුත් කරන ලද වාර්ෂික වාර්තාවේ පලකොට ඇති එක් විශ්ලේෂණයක් ලංකාව තුල ළමා දුප්පත්කමේ ගැඹුර පිලිබඳව එලියක් විහිදුවයි. ළමුන්ගේ දුගීකම මහජනතාව මුහුන දෙන දරිද්‍රතාවයේ එක් පැතිකඩකි.

වාර්තාවට අනුව වතුකරයේ, නාගරිකව හා ගම්බද ජීවත් වන ළමුන්ගෙන් පිලිවෙලින් සියයට 27, 05 සහ 11 යන ප්‍රතිශතයක් දරිද්‍රතාවයෙන් පෙලෙයි. එමෙන්ම වාර්තාව පෙන්වා දෙන පරිදි ලංකාවේ වයස අවුරුදු 5-14 වයස් කාන්ඩයේ වන ළමුන් 3,647,261න් සියයට 11.3 ක් දුප්පත්කමෙන් පෙලෙන අතර ඔවුන්ගෙන් සියයට 6.2 ක් පාසල් නොයයි. මේ පසුගිය දශක හත තුල ධනපති ආන්ඩු විසින් සිදු කරගෙන ගිය ජීවන හා සමාජ කොන්දේසි කප්පාදුවේ සෘජු ප්‍රතිඵලයකි.

ආදායම් දරිද්‍රතාවය හා බහුමාන දරිද්‍රතාවය යන මිනුම් දෙකක් ඔස්සේ මෙහිදී ළමා දුප්පත්කම සමීක්ෂනයට ලක් කර ඇත. ආදායම් දරිද්‍රතා රේඛාව ලෙස සලකා ඇත්තේ දිනක ආදායම ඇමරිකානු ඩොලර් 1.90 යන්නයි. බහුමාන දරිද්‍රතාවය ගනනය කිරීමේදී ළමුන් මුහුන දෙන අධ්‍යාපන, සෞඛ්‍ය හා ජීවන කොන්දේසි සැලකිල්ලට ගෙන ඇත. සමීක්ෂනයට අනුව දුප්පත් ළමුන් ලෙස අර්ථ දක්වා ඇත්තේ ආදායම් දරිද්‍රතාවයෙන් හා බහුමාන දරිද්‍රතාවය යන දෙකෙන්ම පෙලෙන ළමුන්ය.

වාර්තා මගින් ළමා දරිද්‍රතාවය වතුකරයේ, ගම්බදව හා නාගරිකව ව්‍යාප්ත වන ආකාරයද ගෘහ මූලිකයාගේ රැකියාව අනුව වෙනස් වන ආකාරයද හෙලි කෙරේ.

## වතුකරයේ දරිද්‍රතාවය

වතුකරයේ ජීවත් වන ළමුන් 341,061 අතරින් 92,438 ක් එනම් සියයට 27.1 ක් දුප්පත් ළමුන් වේ. ලංකාවේ දරිද්‍රතාවයට මුහුන දෙන ළමුන්ගෙන් සියයට 13 ක් ජීවත් වන්නේ මෙම ප්‍රදේශයේය.

ලංකාවේ කම්කරු පන්තියෙන් දුප්පත්ම කොටසක් වන්නේ වතු කම්කරුවන්ය. වාර්තාවලට අනුව ලංකාවේ දුගී ජනතාවගෙන් සියයට 8.8 ක් ජීවත්වන්නේ වතුකරයේ ය. දරුනු සූරා කෑමකට ලක් වන මෙම කම්කරුවන්, රුපියල් 600 වත් අඩු දෛනික වැටුපකට වතු වල දහදිය හෙලති. මෙම වැටුප් කිසිසේත්ම දරුවන් රැක බලා ගැනීමට හා ඔවුන්ගේ අධ්‍යාපනය සඳහා ප්‍රමානවත් වන්නේ නැත.

අධ්‍යාපන වියදම් පිරිමසා ගැනීමට ඇති නොහැකියාව නිසා බොහෝ ළමුන් පාසල් නොයන අතර මව්පියන්ගේ අඩු වැටුප් මට්ටම් නිසා ඔවුන්ට රැකියාවක නිරත වීමට ද බල කෙරී ඇත. මේ හේතු නිසා වතුකරයේ ළමුන් අත් විඳින්නේ ඉතා පීඩාකාරී කටුක තත්වයන්ය. වාර්තාවට අනුව වතුකරයේ ළමුන්ගෙන් සියයට 8.9 ක් ආදායම් දරිද්‍රතාවයෙන් පෙලෙන අතර සියයට 4.9 ක් ආදායම් හා බහුමාන දරිද්‍රතාවයෙන් පීඩා විඳිනු ලබයි. ප්‍රතිශතයක් වශයෙන් ගත් කල, දරිද්‍රතාවයේ ද, සැලකිල්ලට ගෙන ඇති මිනුම් දෙක වන ආදායම් දරිද්‍රතාවයේ සහ බහුමාන දරිද්‍රතාවයේ ඉහලම මට්ටම වාර්තා වන්නේ වතුකරයෙනි.

## ගම්බද දරිද්‍රතාවය

ගම්බදව වෙසෙන ළමුන් ප්‍රමානය 5,011,208 ක් වන අතර එයින් සියයට 11.2 ක් එනම් 559,529 ක්

දරිද්‍රතාවයෙන් පීඩා විඳියි. ලංකාවේ දරිද්‍රතාවයෙන් පෙලෙන ළමුන්ගෙන් වැඩිම පිරිසක් එනම් සියයට 79.2 ක් ගම්බදව ජීවත් වෙති. වාර්තාවලට අනුව රටෙහි සමස්ත දුප්පතුන්ගෙන් සියයට 82.2 ක් ගම්බදව ජීවත් වෙයි.

මෙහි වෙසෙන බහුතරය කෘෂි කාර්මික කටයුතු මගින් තම ජීවිකාව පවත්වා ගෙන යන්නන්ය. සිය කෘෂි කාර්මික නිශ්පාදන වලට සහතික මිලක් නොමැති වීම, නියගය නිසා වගාවන් විනාශවීම ආදී

විවිධ හේතු  නිසා මේ පවුල් වල ඇත්තේ අස්ථාවර ආර්ථිකයකි. මීට අමතරව, ලබාගත් නය ගෙවීමට නොහැකිව ඉහිලිය නොහැකි මට්ටමේ නය බරක් ද මෙම පවුල් මතට පැටවී දුගීබවේ පතුලටම ඔවුන් ඇද වැටී ඇත. මුහුන දෙන ආර්ථික දුෂ්කරතා මත, දෙමාපියන්ගේ කෘෂි කාර්මික කටයුතු වලට සම්බන්ධ වීම ඇතුලු විවිධ හේතු නිසා ගම්බද ලමුන්ට අධ්‍යාපනය ලැබීමට ඇති අවස්ථා සීමිත වී ඇත.

වාර්තාවට අනුව ගම්බද ලමුන්ගෙන් සියයට 7.5 ක් ආදායම් දරිද්‍රතාවයෙන් පීඩා විඳියි.

## නාගරික දරිද්‍රතාවය

නාගරික ප්‍රදේශ වල ජීවත් වන මුලු ලමුන් සංඛ්‍යාව 1,097,070 ක් වන අතර එයින් සියයට 5.0 ක් එනම් 54,937 ක් දරිද්‍රතාවයෙන් පෙලෙන ලමුන් වේ. ලංකාව තුල දුප්පත්කමට ඇද වැටී ඇති ලමුන්ගෙන් සියයට 7.8 නාගරිකව ජීවත් වෙයි.

මෙම ලමුන්ගෙන් බහුතරයක් අයත් වන්නේ කම්කරු පවුල් වලටය. විරැකියාව, අර්ධ-කාලීන රැකියා, නාගරික සංවර්ධනයේ කඩතුරාව යටතේ බලහත්කාරී ඉවත් කිරීම් හේතුවෙන් ජීවනෝපායන් අහිමි වීම  සහ වැටුප් මට්ටම් පහත හෙලීම නාගරික දරිද්‍රතාව වැඩි වීමට තුඩුදී ඇත.

දිවයිනේ සමස්ත දුප්පතුන්ගෙන් සියයට 9 ක් ජීවත් වන්නේ නාගරිකවය. දැරිය නොහැකි අධ්‍යාපන වියදම් නිසා බොහෝ ලමුන්ගේ පාසල් අධ්‍යාපනය අතරමග ඇන හිට ඇත. මෙහි සිටින ලමුන්ගෙන් සියයට 2.3ක් ආදායම් දරිද්‍රතාවයෙන් පෙළේ.

## ගෘහ මූලිකයාගේ රැකියාව අනුව දරිද්‍රතාවය

දුප්පත් ලමුන්ගෙන් සියයට 23.1 ක පවුල් වල ගෘහ මූලිකයන් වනුයේ කෘෂි කාර්මික හා ධීවර කටයුතු    ආශ්‍රිතව රැකියා කරන්නවුන්ය. රැකියා කාන්ඩ අතරින් දුප්පත් ලමුන් වැඩිම ප්‍රතිශතයක් අයත් වන්නේ මෙම කාන්ඩයටය. ගෘහ මූලිකයාගේ රැකියාව කෘෂි කාර්මික නොවන දුප්පත් ලමුන්ගේ ප්‍රතිශතය සියයට 16.4 කි. දුප්පත් ලමුන්ගෙන් සියයට 13.4 ක ගෘහ මූලිකයාට වයස් ගත වීම වැනි හේතු මත රැකියාවක් කිරීමට හැකියාවක් නොමැත. දුප්පත් ලමුන්ගෙන් සියයට 16.1 ක ගෘහ මූලිකත්වය දරන්නේ පුහුනු කෘෂි කාර්මික, වන හෝ ධීවර කටයුතු ආශ්‍රිතව රැකියා කරන්නවුන්ය.

මේ අනුව පැහැදිලි වන්නේ ලමා දරිද්‍රතාවයට ගෘහ මූලිකයාගේ රැකියාව ඍජුවම බලපාන බවයි.

## ලමා අධ්‍යාපනය

ලංකාව තුල වයස අවුරුදු 5  ත් 14 ත් අතර ලමුන් 3,467,261 ක් සිටින අතර ඉන් සියයට 88.7 ක්, එනම් 3,075,800 ක් දුප්පත් නොවන ලමුන් වන අතර සියයට 11.3 ක්, එනම් 391,461 ක් දුප්පත් ලමුන් වේ. වයස 15-16  වයස් කාන්ඩය ගත් කල ඉන් සියයට 11.5  ක් දුප්පත් ලමුන් වේ. වයස අවුරුදු 17-18 ත් අතර ලමුන්ගෙන් සියයට 9.7 ක් දුප්පත් ලමුන් වර්ගයට අයත් වේ.

වයස අවුරුදු 5  ත් 14ත් අතර දුප්පත් ලමුන්ගෙන් සියයට 6.2 ක් පාසල් නොයන අතර දුප්පත් නොවන ලමුන්ගෙන් සියයට 0.8 ක් පාසල් නොයයි. වයස අවුරුදු 15-16  වයස් කාන්ඩයේ දුප්පත් ලමුන්ගෙන් සියයට 23.8 ක් පාසල් අධ්‍යාපනය නොලබන අතර දුප්පත් නොවන ලමුන්ගෙන් සියයට 8.1ක් පාසල් අධ්‍යාපනය නොලබයි.

වයස අවුරුදු 17-18ත් අතර දුප්පත් ලමුන්ගෙන්  සියයට 64.7 පාසල් නොයයි. මෙයින් පෙන්නුම් කෙරෙන්නේ දුප්පත් ලමුන්ගෙන් බහුතරයක් ද්විතීයික අධ්‍යාපනය නොලබන බවයි.

පසුගිය දශක කිහිපය පුරා ධනපති ආන්ඩු විසින් අධ්‍යාපන ක්ෂේත්‍රය තුල සිදු කරගෙන ගිය කප්පාදු වැඩ පිලිවෙල පාසැල් අධ්‍යාපනය හැර යාමට බොහෝ සෙයින් බල පා ඇත. මෙම කප්පාදු හේතුවෙන් කුඩා පාසල් බොහොමයක් වැසී ගියේය. තම නිවෙස ආසන්නයේ තිබූ පාසැල් වැසී යාමෙන් පසු ඈත පිහිටි පාසැලකට යාමේ දී ඇතිවන ආර්ථික සහ ගමන් දුෂ්කරතා හේතුවෙන් බොහෝ ලමුන්ට ද්විතීයික අධ්‍යාපනය හැර දැමීමට සිදුව ඇත.

මෙම වයස් කාන්ඩයට එන විට අධ්‍යාපනය සඳහා වන වියදම් ක්‍රමයෙන් වැඩිවී තම දෙමව්පියන්ට දැරිය නොහැකි තත්වයට පත්වන නිසාත්, දුගීබව හේතුවෙන් පවුලේ ආර්ථිකයට උදව් කිරීම සඳහා රැකියා සොයා යෑමට බල කෙරී ඇති නිසාත්, වයස 17-18 වයසේ දුප්පත් ලමුන් බොහොමයකට පාසැල් හැර යාමට සිදු වෙයි.

© www.wsws.org